# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,164 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 512 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 514 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 මාර්තු මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## අංක 194/MB දරන නඩුවට අදාළව මාරවිල දිසා අධිකරණයේ ඇස්කීසි අංක 13/2020 යටතේ පිස්කල් මගින් කරනු ලබන වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව එදිරිව - 1. සනුරි ඔටෝ ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්
2. යාපා අප්පුහාමිලාගේ කපිල සමන්ත යාපා

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, දකුණු පිටිගල් කෝරළේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමා තුල පිහිටි, මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්, මහවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මහවැව නමැති ගමේ පිහිටි, දන්වල අගාර නමැති ඉඩමට, ඒ. ඒ. විමලසේන බලයලත් මානක තැන විසින් 2006.10.31 වන දින මැන සාදන ලද අංක 3512 ඒ දරන පිඹුර ප්‍රකාර අංක 01 දරන ඉඩම් කොටසට මායිම්,

උතුරට : එම්. ඩී. ප්‍රනාන්දු බලයලත් මානක තැනගේ අංක 3035 දරන පිඹුරේ ලොට් අංක 02 දරන කොටස ද, නැගෙනහිරට : අනුලා අමරතුංග සහ සීලවතී අමරතුංගට අයිති ඉඩම සහ එම්. ජී. දයානන්දට අයිති ඉඩම ද, දකුණට : ඩබ්. ජී. සේදිරිස් අප්පුහාමිට අයත් ඉඩම සහ ආර්. ජී. ඇලෝ සිංඤෝට අයිති ඉඩම ද, බස්නාහිරට : ආර්. ජී. ඇලෝ සිංඤෝට අයිති ඉඩම සහ ප්‍රාදේශීය සභා පාර ද,

යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසිතුන (අක්. 0, රූඩ්. 02, පර්. 23) ක් හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි හයයි බින්දුවයි හය (හෙක්. 0.2606) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග වේ.

*ඉඩමේ ප්‍රමාණය* : අක් 0, රූඩ් 02, පර්. 23 කි. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 110/149 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම*.- පුත්තලම A3 ප්‍රධාන මාර්ගය ඔස්සේ මහවැව පන්සල් හංදිය දක්වා ගමන් කර එම හංදියෙන් (59 වැනි මීටර් කණුව) වමට හැරී පන්සල පාරේ මීටර් 400 ක් පමණ ගමන් කරන විට T හංදියක් හමු වේ. එතැනින් වමට හැරී මීටර් 250 ක් පමණ ගොස් නැවත වමට හැරී එම පාරේ යාපා ස්ටෝර්ස් පිහිටා ඇති, වංගුව අසල වම් පැත්තට වන ලෙස අදාල දේපල පිහිටා ඇත.

නි/පිස්කල් විසින් 2020 මාර්තු මස 24 වන දින ප.ව. 2.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ මිළ නියම වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල
4. සියලුම ප්‍රචාරක ගාස්තු
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

*අදාල දේපළ විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුලත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කල යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කල මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාල ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල) අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබා ගත හැක.

දුරකථන : 032-2253300, 032-2253301
ෆැක්ස් : 032-2255247

රෙජිස්ට්‍රාර්/නි/පිස්කල්,
දිසා අධිකරණය,
මාරවිල.

02-605

**අංක 55/MB දරන නඩුවට අදාලව පුත්තලම දිසා අධිකරණයේ ඇ/අංක 03/2020 යටතේ පිස්කල් මගින් කරනු ලබන වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, කල්පිටිය කෝරළේ, කල්පිටිය පත්තුවේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, කන්දක්කුලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් කන්දක්කුලිය නමැති ගමේ පිහිටි, මොහමඩ් තම්බි කුඩියිරුක්කුම් තෝට්ටම් නැමති ඉඩමට, එම්. එච්. සබාර් බලයලත් මානක තැන විසින් 2012.07.03 වන දින මැන සාදන ලද අංක 1829 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්,

උතුරට : ප්‍රාදේශීය සභා පාර සහ ඩබ්. ජුඩ් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඩබ්. ආර් මාලනී පෙරේරාට අයිති ඉඩම ද දකුණට : එස්. එච්. අබුතාහිර්ගේ ඉඩමද, බස්නාහිරට : එම්. අලව්දීන්ගේ ඉඩම ද, යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහඅට (අක්. 0, රූඩ් 01, පර්. 18) ක් විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමඟ වේ.

*ඉඩමේ ප්‍රමාණය* : අක් 0, රූඩ් 01, පර්. 18 මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 140/265 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම.*- කල්පිටිය පාලවිය මාර්ගයේ කුරිඤ්ඤම්පිටිය හන්දිය දක්වා පැමිණ එම හංදියෙන් දකුණට ඇති කන්දකුලිය පාරේ කි. මී. 05 ක් පමණ යන විට හමුවන ඉන්ධන පිරවුම්හල පසුවී හමුවන තුන්මං හන්දියෙන් වමට ඇති පාරේ මී. 100ක් පමණ යනවිට පාරේ වම් පස හමුවන අඩි පාරේ (වැලි පාරේ) මී. 25 ක් පමණ යනවිට දකුණුපස මෙම දේපල පිහිටා ඇත.

නි/පිස්කල් විසින් 2020 මාර්තු මස 27 වන දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ මිළ තීන්දුව වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල
4. සියලුම ප්‍රචාරක ගාස්තු
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

* අදාල දේපල විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුලත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කල යුතු වේ.

ඉහත සඳහන් කල පරිදි දින 30 ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කල මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාල ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබාගත හැක.

දුරකථන : 032-2253300, 032-2253301
ෆැක්ස් : 032-2255247

රෙජිස්ට්‍රාර්/නි/පිස්කල්,
දිසා අධිකරණය,
පුත්තලම.

2020 පෙබරවාරි මස 06 වැනි දින.

02-606

# විවිධ දැන්වීම්

## පෙත්සම පිළිබඳ දැන්වීම

කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වානිජ මහාධිකරණයේ දී ය

හෝකන්දර, හෝකන්දර දකුණ, අංක 69/1 හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඈවර කිරීම කාරණාව සම්බන්ධවයි.

*නඩු අංකය :* HC (Civil)/58/2019/CO

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ 270(අ) සහ/හෝ (ඉ) සහ/හෝ (ඊ) යන වගන්ති යටතේ ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසුරුවා හැරීම සඳහා 272(1) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 69/1, හෝකන්දර දකුණ,
හෝකන්දර.

.............................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ඈවර කිරීම සඳහා වර්ෂ 2019 ක් වූ ජූලි මස 25 වන දිනැති පෙත්සමක්, කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වානිජ මහාධිකරණයේ ඉහත නම් සඳහන් පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය විසින් ඉදිරිපත් කරනු ලැබ, වර්ෂ 2020 ක් වූ මාර්තු මස 19 වැනි දින එකී අධිකරණයේ දී, ඒ පිළිබඳව විමසීමට නියම කිරීම සඳහා කැඳවන අතර, ඒ පිළිබඳව එකී සමාගමේ ණය හිමියකු හෝ සහදායකයකු විසින් එකඟත්වය හෝ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට කැමැත්තෙහි නම්, එවැනි යම් ණය හිමියකු හෝ සහදායකයෙකු විසින් පුද්ගලිකව පෙනී සිට හෝ නීතිඥයකු මගින් ඒ සඳහා පෙනී සිටිය යුතු වන අතර, එකී සමාගමේ යම් ණය හිමියකු හෝ සහදායකයකු හට පෙත්සමේ පිටපත් නියමිත ගාස්තු ගෙවීමෙන් පසු පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 700/120, පෙරේරා මාවත, තලවතුගොඩ.

***සටහන.***- යම් පුද්ගලයකු එකී පෙත්සම පිළිබඳ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන්නේ නම්, ඒ බව නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය වෙත ලිඛිතව දැන්වීම් භාරදීමෙන් හෝ තැපැල් මගින් හෝ දන්වා සිටිය යුතු අතර, එම දැන්වීමේ යම් පුද්ගලයකු නම්, නම සහ ලිපිනය ද, ආයතනයක් නම් ආයතනයේ නම සහ ලිපිනය ද, දක්වා පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් අත්සන් තබා භාරදිය යුතු අතර තැපෑලෙන් එවන්නේ නම්, අවශ්‍ය කාලසීමාව ඇතිව වර්ෂ 2020 ක් වූ මාර්තු මස 18 වැනි දින ප.ව. 6.00 ට පෙර ඉහත සඳහන් නීතිඥ තැන වෙත භාර දිය යුතු බව ද දන්වා සිටිමි.

02-684

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.